## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව
## අනුරාධපුර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 16 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 13 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2. ව්‍යාවනය කළ මතය

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ජා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

1.3 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් අනුගමනය කල ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කල යුතු වේ. | පිළිගතිමි. විගණනය විසින් පෙන්වාදුන් පරිදි නිවැරදිව ඉදිරියේදි ක්‍රියාත්මක කිරිමට කටයුතු කරමි. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2017 වර්ෂයේ මුද්දර බදු ආදායම රු.250,750 ක් සහ සමාලෝචිත වර්ෂයේ රු.615,950 ක මුද්දර බදු ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.1,000,000 ලෙස දක්වා තිබුණු බැවින් රු.133,300 අඩුවෙන් දක්වා තිබුණි. | මුද්දර බදු ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිලිගනිමි. 2017 වර්ෂයට මුද්දර ආදායම රු. 750 750 ක් වූ අතර අපට මුදලින් නොලැබුනු බැවින් එම ආදායම් ගිණුම් ගත නොකර මුදලින් ලැබුන පසුව රු. 750,750 ක මුදල ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල වරෙන්තු හා දඩ ආදායම රු.151,499 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල සම්පූර්ණ ආදායම ගිණුම්ගත කල යුතු වේ. | වර්ෂයට අදාල වරෙන්තු හා දඩ ආදායම 3867153 ක් වුවත් රු 151,499 මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම සකස් කිරිමෙන් පසු ලැබුන අතර එම මුදල ඉදිරියේ දී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර සභාවට ලබා දී තිබුණු ව්‍යාපෘති දෙකක් ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කිරිමේදි රු.1,954,129 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අවසන් බිල්පතේ වටිනාකම අදාල වත්කමේ වටිනාකම ලෙස සැලකිය යුතු වේ. | පුර නැගුම ව්‍යාපෘතිය මගින් අපට ලබා දී ඇති තොරතුරු අනුව ගිණුම් ගත කර ඇති තොරතුරු නිවැරදි බව දන්වමි. |
| ( iv) | සමාලෝචිත වර්ෂයේ රු.9,724,392 ක්වූ සභාව සතු වත්කම් ඒකක 08 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වත්කම්වල වටිනාකම තක්සේරු කර හෝ හදුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරියේදී ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි 09 කට අදාල වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි. | වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි.<br>ඉඩම් හා ගොඩනැගිලි 09 ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට තක්සේරු කිරිමට ලිපි යවා තිබු නමුත් මේ වන තෙක් තස්සේරු කර එවා නොමැත.ඉදිරියේ දී මෙම ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව තක්සේරු කර ගිණුම් ගත කිරිමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) අසම්භාව්‍ය බැරකම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොකුණු ව්‍යාපෘතියට අදාලව තවදුරටත් ගෙවිය යුතු මුදල රු.4,245,707 සහ 2012 මාර්තු 01 න් පසුව ජනිත වු නෛතික පොලිය ගණනය කර ඒ මත පැනගින අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | තවදුරටත් ගෙවිය යුතු මුදල සහ 2012 මාර්තු 01 දිනයෙන් පසුව ජනිත වන නෛතික පොලිය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කලයුතු වේ. | පිළිගනිමි.<br>2012 මාර්තු 01 පසුව ජනිත වන නෛතික පොලිය ගණනය කර ලබා දෙන බවට අධිකරණ රෙජිස්ටාර් වාචිකව ප්‍රකාශ කර ඇත.ඉදිරියේ දී අදාල නෛතික පොලිය ගණනය කර අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කරමි. |

(ඇ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගිණුම් විෂයයන් 08 කට අදාලව ශේෂ පත්‍රයේ දක්වා තිබූ වටිනාකම හා ලේඛනවල දක්වා තිබූ වටිනාකම අතර රු.4,025,077 ක එකතු වෙනසක් පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතුවේ. | හිඟ හිටි උසාවි දඩ හිඟ හිටි මුද්දර ගාස්තු, නොගෙවූ විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝශිත විවිධ ණයහිමි, කර්මාන්ත ණයහිමි හිඟ, වෙනත් ආදායම් ඉදිරියේ දී ඇතුලත් කිරිමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් හා සංචිත ශේෂය ශේෂ පිරික්ෂුම අනුව රු.181,006,373 ක් ලෙස දක්වා ශේෂ පත්‍රයේ රු.18,100,637 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.162,905,736 ක වෙනසක් පැවතුණි. | ගිණුම් පිළියෙල කිරිමේදි පවතින මුද්‍රිත දෝෂ පරික්ෂාකර නිවැරදි තොරතුරු ඉදිරිපත් කළයුතු වේ. | පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ රු.210,098,865 ක වටිනාකමට අදාලව දක්වා තිබුණු සටහන්වල තත්‍ය එකතුව රු.412,029,765 ක් වූයෙන් රු.212,069,100 ක් එකතු වෙනසක් පැවතුණි. | ශේෂවල ඇති නොසැසඳීම් නිවැරදි කර ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි<br>ඉදිරියේදී නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක ණය මුදල උපලේඛන අනුව රු.3,837,733 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.3,766,466 ක් ලෙස දක්වා තිබීම නිසා රු.71,267 ක වෙනසක් පැවතුණි. | ශේෂවල ඇති නොසැසඳීම් නිවැරදි කර ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගතිමි.<br>වර්ෂයේ හිඟ මුදල හා ණය ශේෂය එකතු කර මූල්‍ය ප්‍රකාශ වලට ගෙන ඇත.එය ස්ථාන මාරු වී ගිය පුද්ගලයන්ගේ 2018 වර්ෂයේ ගෙවිය යුතු හිඟ මුදල වේ. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් ලේඛනවල දැක්වෙන වටිනාකම රු. 6,837,444 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන වල රු.2,062,295 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 8,842,739 ක එකතු වෙනසක් පැවතුණි. | සියළුම තැන්පත් ලේඛන වාර්ෂිකව යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | මෙම කාරණාව පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ. |

(ඉ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට පැවත එන රු.1,130,292 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය පිළිබඳව සොයා බලා අවශ්‍ය ගැලපීම් කර නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකිරිමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරියේ දී නිවැරදි කරමි. |

(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.65,960 ක් වු ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක් වසර 5 ක් ඉක්මවු කාලයක සිට අයනොවී පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි<br>ඉදිරියේ දී නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.974,459 ක් වු ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් වසර 5 ක් ඉක්මවු කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි.<br>ගෙවිය යුතු ගිණුම් ඉදිරියේදී වාරික වශයෙන් ගෙවීමට කටයුතු කරමි. |

(උ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.120,332,530 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාලව වත්කම් ලේඛන, තක්සේරු සහතික, සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛන, වයස් විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීමේ ලිපි සහ විස්තරාත්මක ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගතිමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන)රීති සංග්‍රහය | | | |
| | රීති 217හා 218 | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යාමට හා සෑම වර්ෂයකටම වරක් පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කල යුතු වේ. | ලේඛනයක් සකස් කර නොමැති බව සහ වාර්ෂිකව පරීක්ෂාව කර නොමැති බව පිළි ගතිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ මුදල් රෙගුලාසි | | | |
| | 1647(ඉ) | වාහන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතු වේ | පිළිතුර ඉදිරිපත් කර නැත. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛය | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතු වේ. | පිළිගනිමි ඉදිරියේදි පරික්ෂා කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2009 ජූනි 17 දිනැති අංක 09/2009(I) දරන චක්‍රලේඛය | ඇඟිලි සළකුණු කිරීමේ යන්ත්‍ර ස්ථාපිත කර නොතිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි ඉදිරියේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීමට කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) හාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/2 හාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි දැනටමත් මීට අදාල ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කරමින් පවතී. |

02. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,769,582 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,138,909 ක් විය

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල් කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේනතු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,072,920 | 2,433,317 | 2,024,217 | 5,387,865 | 2,072,920 | 2,152,687 | 2,097,092 | 4,978,765 |
| (ii) | කුලී | 5,557,250 | 5,410,420 | 5,666,955 | 95,770 | 4,097,020 | 4,955,892 | 4,868,572 | 352,305 |
| (iii) | බලපත්‍ර ගාස්තු ,සේවා | 5,331,000 | 4,546,902 | 4,389,652 | 157,250 | 5.283.000 | 3,309,848 | 3,309,848 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,158,000 | 7,104,001 | 2,155,270 | 7,271,827 | 1,874.100 | 8,091,848 | 9,557,269 | 2,323,096 |
| | | 16,119,170 | 19,494,640 | 14,236,094 | 12,912,712 | 13,327,040 | 18,510,275 | 19,832,781 | 7,654,166 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රැස් කළ යුතු සමස්ථ ආදායම රු.27,348,806 ක් වුවද එම ආදායමින් සියයට 52 ක් වූ රු.14,326,094 ක් පමණක් රැස්කර තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිතුර ඉදිරිපත් කර නැත |

2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව සභාබල ප්‍රදේශයේ සංවර්ධිත ප්‍රදේශ ප්‍රකාශයට පත්කර, දේපළ වාර්ෂික තක්සේරුවක් සිදුකර වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පනත අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි<br>ගලෙන්බිඳුණුවැව නාගරික බල ප්‍රදේශයේ වරිපනම් අය කිරීම සම්බන්ධ සිතියම් ගත කර ගැසට් කර නොමැත. මේ නිසාවෙන් දේපල තහනමට ගැනිම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගැටළු සහගත තත්වයක් පැන නැගී ඇත. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 59 -66 දක්වා රීති ප්‍රකාරව වෙළඳ බලපත්‍ර,කර්මාන්තබදු, වෘත්තිය බදු අයකළ යුතු ආයතන සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර තිබුණද ඒවා ලේඛනගත කොට ගාස්තු ගෙවීම පැහැරහැරීම පිළිබඳ කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි<br>ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු සම්බන්ධව සමීක්ෂණ සිදුකර ඒවා ලේඛන ගත කොට ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ පවත්වා ලේඛනගත කර ගාස්තු අයකිරිමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි.<br>මේ සඳහා කාර්යය මණ්ඩලය යොදවා ඇති අතර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | පරිසර බලපත්‍ර ලබාගත යුතු පාර්ශව හඳුනාගෙන එම බලපත්‍ර ගාස්තු අයකිරිමට කටයුතු කර නොතිබුණි. | බලපත්‍ර ගාස්තු අය කිරිමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි<br>ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ පවත්වා ගාස්තු අයකිරිමට කටයුතු කල යුතු වේ | පිළිගනිමි.<br>ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබද කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබදව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනත අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි.<br>අතුරු ව්‍යස්ථා සැකසීම සඳහා වූ කාරණාව පළාත් පාලන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර, සකස් කිරීම සඳහා කටයුතු ඉටු කිරීම ආරම්භ කර ඇත. |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරි සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි පිළියෙළ කල යුතු වේ. | පිළිගනිමි.<br>දැනටමත් කාර්යය ආරම්භ කර ඇත. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ). අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ජේදයේ රු.18,128,075 ක් වියදම දරා ඉදිකර තිබුණු අශ්වයාබැදිවැව ජල ව්‍යාපෘතිය ඉදිකිරීම් සහ සවිකිරීම්වල තාක්ෂණික දෝෂ වූ නිසා විගණිත දිනය වන 2019 මැයි 12 දින වන විටත් ව්‍යාපෘතිය අක්‍රියව පැවතුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වේ | පිළිගනිමි.<br>ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට දැනටමත් මූලික කටයුතු සිදුකර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් වී ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකල යුතු වේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොකුණු ව්‍යාපෘතියට අදාලව නඩු තීන්දුව ප්‍රකාරව සභාවේ දේපල වෙන්දේසි කිරීමෙන් පසුව තවදුරටත් ගෙවිය යුතු මුදල රු.4,245,707 ක් පැවතුණි. තවදුරටත් ගෙවිය යුතු මුදල් සම්බන්ධව කළමනාකාරිත්වය අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර විධිමත් එකඟතාවයකට පැමිණ නොතිබුණි. | සභා කළමණාකාරිත්වය සහ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මෙම අක්‍රමිකතාවය පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමටත්, ගෙවිය යුතු මුදල් නිරවුල් කර ගැනීමට පියවර ගත යුතු වේ. | පිළිගනිමි.<br>2019.06.21 දින මහ සභාව මේ සම්බන්ධයෙන් සභා තීරණයක් ලබා ගෙන ඇත ඒ අනුව මේ සඳහා ඍජුව වගකිව යුතු පාර්ශවය වන උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර මේ සඳහා ප්‍රාදේශිය සභාවෙන් අය කර ගත් මුදල් අය කර ගැනීමටත්, කොන්ත්‍රාත් සංවිධානයට තව දුරටත් ගෙවිය යුතු මුදල් උතුරු මැද පළාත් සභා 2020 අය වැයට ඇතුලත් කර ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවට ඉල්ලීම සිදු කිරීමටත් සභාව තීරණය කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 13 ක් වූ අතර අතිරික්ත සේවක සංඛ්‍යාව 03 ක්විය.නමුත් අනියම් කාර්ය මණ්ඩලය 06 ක් සිටින බවද අනාවරණය විය. | සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනිමට කටයුතු කළයුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි.<br>අනුමත සේවක සංඛ්‍යාව 4 ක් වුවද පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ සහායක තනතුරු 02 ක් සභාවට අනුයුක්ත කර ඇත. සෞඛ්‍ය කම්කරු තනතුරු 06 ක් අනුමත වුවද, සෞඛ්‍ය කම්කරු තනතුරු 07 ක් ඒ සේවයට යොදවා |

| | | | |
|---|---|---|---|
| | | | ඇත. ඒ අනුව අතිරික්ත තනතුරු 03 ඇති බව සඳහන් කරමි. සභා තීරණ මත පළාත් පාලන දෙපාර්තමේන්තු නිර්දේශ සමග අනියම් තනතුරු 06 ක් බඳවා ගැනීමට සිදුවිය. |
| (ආ) | ස්ථාන මාරුවී ගොස් විශ්‍රාම ගොස් තිබුණු නිලධාරින් 16 දෙනෙකුගෙන් ලබාගත් සේවක ඇප තැන්පතු රු.63,408 ක් අදාල නිලධාරින් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අදාල ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 1991.11.03 දිනැති අංක 04/1999 උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ ආයතන චක්‍රලේඛ අනුගමනය කිරිමට ඉදිරියේ දී කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය
----------------------------

3.4.1 පවරා නොගත් වත්කම්
--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ---------------------------- |
| සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 12 ක අයිතිය සභාව වෙත පවරාගැනීමට කටයුතුකර නොතිබුණි. | අයිතිය පවරාගෙන ගිණුම්ගත කල යුතු වේ. | ප්‍රාදේශීය සභාව අපහසුතාවයට පත්ව ඇති අධිකරණ ක්‍රියාදාමය හේතුවෙන් අලුතින් වත්කම් සභාවට පවරා ගැනීම මෙතෙක් සිදුකර නොමැත. ඉදිරියේ දී සභා තීරණය , පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර උපදෙස් අනුව කටයුතු ඉටු කර විගණනය සඳහා ඉදිරිපත් කරමි. |

3.4.2 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ----------------------------------- |
| 2016 වර්ෂයේදි සභාව වෙත ලැබි තිබුණු රු.2,655,318 ක් වටිනා අංක WPRD-9486 දරන ට්‍රැක්ටරය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | අවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකර වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතු වේ. | මේ සඳහා කටයුතු කරමින් සිටින අතර ප්‍රවාහන ඉංජිනේරු වෙතින් අළුත්වැඩියාව පිළිබඳ වාර්තාවක් ලබා ගෙන අළුත්වැඩියාව සිදුකර යථා පරිදි සේවාව ලබා ගැනීමට කටයුතු කරමි. |

3.4.3 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව කාර්යාලය තුල භාණ්ඩ අයතම 62 ක ඌණතාවයක් අනාවරණය විය. | එම ශේෂයන් සොයා බලා නිවැරදි කිරිම් සිදුකල යුතු වේ. | පිළිගනිමි ඉදිරියේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2014 වර්ෂයේදි හා 2016 වර්ෂවලදි සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කල යුතු වේ. | පිළිගනිමි ඉදිරියේදි එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ගලෙන්බිදුණුවැව පුස්තකාලයේ 2018 දෙසැම්බර් 31 දිනට පරිග්‍රහන ලේඛන අනුව රු.120,581 වටිනා පොත් 1354 ක් හිගව පැවතුණි. | සොයා බැලීම් සිදුකර අවශ්‍ය කටයුතු සිදුකල යුත වේ. | පිළිගනිමි ඉදිරියේ දී මීට හේතු සොයා බලා කටයුතු කරමි. |